# සාමාන්‍ය සමයේ දස නවවන සතිය
# සිකුරාදා

## සුවිශේෂය

සුවිශේෂක මතෙව් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

මතෙව් 19: 3-12

**"ඔබේ සිත් දැඩිකම නිසා මෝසෙස් දික්කසාදයට ඉඩ දුන් නමුත් පටන් ගැන්මේ සිට එසේ නොවීය."**

පරිසිවරු ජේසුස් වහන්සේ වෙතට පැමිණ උන්වහන්සේ වචනයකින් අල්ලා ගන්නා පිණිස, "යමෙකු විසින් කුමන කරුණක් නිසාවත් සිය භාර්යාව දික්කසාද කිරීම නීතියට අනුකූලදැ"යි උන්වහන්සේගෙන් ඇසූහ. උන්වහන්සේ උත්තර දෙමින්, "පටන් ගැන්මේ සිටම මැවුම්කාරයාණන් පිරිමි ගැහැණු වශයෙන් මනුෂ්‍ය වර්ගයා මැවූ බව ඔබ කියවා නැද්ද? ඒ නිසා මිනිසෙකු තම පියා ද මව ද අත්හැර සිය භාර්යාවට ඇලුම් වන බවත්. ඒ යුවළ එක්කෙනෙකු වන බවත් දෙවියන් වහන්සේ වදාළ සේක. මෙසේ ඔව්හු එවක් පටන් දෙදෙනෙකු නොව එක්කෙනෙක් වෙති. එබැවින් දෙවියන් වහන්සේ එක් කළ අය මනුෂ්‍යයා වෙන් නොකෙරේවා"යි වදාළ සේක. ඔව්හු කතා කොට, "එසේ වී නම් දික්කසාද සහතිකයක් දී ඇය අත්හරින්ට මෝසෙස් අණ කළේ මන්දැ"යි උන්වහන්සේගෙන් ඇසූහ.

උන්වහන්සේ පිළිතුරු දෙමින් "මෝසෙස් ඔබගේ භාර්යාවන් දික්කසාද කිරීමට අවසර දුන්නේ ඔබගේ සිත් දැඩිකම නිසා ය. එහෙත් පටන් ගැනීමේ සිට එසේ නොවී ය"යි ඔවුන්ට වදාළ සේක. "තවදුරටත් මම ඔබට මෙසේ කියමි. වේශ්‍යාකම නිසා මිස අන් හේතු නිසා තම භාර්යාව

දික්කසාද කොට වෙන ස්ත්‍රියක සරණ පාවා ගන්න කවරෙක් නමුත් කාමමිථ්‍යාචාරය කරන්නේය. දික්කසාද කරනු ලැබූ ඒ ස්ත්‍රිය විවාහ කරගන්නා ද කාමමිථ්‍යාචාරය කරන්නේය.”

ශ්‍රාවකයෝ උන්වහන්සේට කතා කොට, “ස්ත්‍රිය හා පුරුෂයා අතර සම්බන්ධය මෙසේ නම් විවාහ නොවී සිටීම වඩා හොඳ ය”යි කීහ. එහෙත් උන්වහන්සේ ඔවුන්ට කතා කරමින්, “දේව වරමක් ලැබූ අයට මිස හැම දෙනාටම මේ ප්‍රතිපත්තිය පිළිපැදිය නොහැකි ය. මන්ද උත්පත්තියෙන්ම විවාහ විය නොහැකි අය සිටිති. මනුෂ්‍ය බලපෑම නිසා විවාහ විය නොහැකි අය ද සිටිති. ස්වර්ග රාජ්‍යය අරභයා සිය කැමැත්තෙන්ම විවාහ නොවන අයත් සිටිති. මේ තත්ත්වය පිළිගන්නට හැකි තැනැත්තේ පිළිගනීවා”යි වදාළ සේක.

සුවිශේෂ වාක්‍යය එසේය.